# මහා සභා වාර්තාව - කටුවන ප්‍රාදේශීය සභාව

# 2023 පෙබරවාරි 09 වන දින

❖ **08 වන සැසි වාරයේ 58 වන සභා වාර්තාව**

**දිනය :- 2023.02.09 වන දින**

**වේලාව :- පෙ.ව.10.00**

**ස්ථානය :- ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මිද්දෙණිය**

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. | ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා | පෙ.ව. 10.00 |
| 02. | ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 03. | ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා | පෙ.ව. 10.00 |
| 04. | ගරු ප්‍රා.ස.ස. ජේ.එල් ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 05. | ගරු ප්‍රා.ස.ස. පී කොඩිතුවක්කු මැතිතුමා | පෙ.ව. 10.00 |
| 06. | ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 07. | ගරු ප්‍රා.ස.ස. එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 08. | ගරු ප්‍රා.ස.ස. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 09. | ගරු ප්‍රා.ස.ස. ජේ.ටී.ශාන්ත ජයලත් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 10. | ගරු ප්‍රා.ස.ස. එම්.ඩී. සුගතදාස මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 11. | ගරු ප්‍රා.ස.ස. ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 12. | ගරු ප්‍රා.ස.ස. මානෙල් දිසානායක මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 13. | ගරු ප්‍රා.ස.ස.එච්.කේ.ඒ ආනන්ද කුලසුන්දර මැතිතුමා. | පෙ.ව.10.00 |
| 14. | ගරු ප්‍රා.ස.ස. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා | පෙ.ව. 10.00 |
| 15. | ගරු ප්‍රා.ස.ස. කේ.කේ.ජී. සුමෛත්‍රා මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 16. | ගරු ප්‍රා.ස.ස. ආරියරත්න ඒකනායක මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 17. | ගරු ප්‍රා. ස. ස. ජේ.ඒ. ගාමිණී මැතිතුමා | පෙ.ව.10.00 |
| 18. | ගරු ප්‍රා.ස.ස. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා | පෙ.ව. 10.00 |
| 19. | ගරු ප්‍රා.ස.ස. සුගත් සරඹගේ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 20. | ගරු ප්‍රා.ස.ස. එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා | පෙ.ව. 10.00 |
| 21. | ගරු ප්‍රා.ස.ස. එච්.ඒ. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය | පෙ.ව.10.00 |
| 22. | ගරු ප්‍රා.ස.ස. එන්.ඒ.එස්. වීරසිරි මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 23. | ගරු ප්‍රා.ස.ස. ඩී.රාජපක්ෂ මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 24. | ගරු ප්‍රා.ස.ස. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 25. | ගරු ප්‍රා.ස.ස. අයි.කේ. සුසන්ත පත්ම තිලක් මැතිතුමා. | පෙ.ව.10.00 |
| 26. | ගරු ප්‍රා.ස.ස. ඊ.බී. ඉන්දික මැතිතුමා. | පෙ.ව.10.00 |
| 27. | ගරු ප්‍රා.ස.ස. ඩබ්.ඒ. සංජීව මැතිතුමා. | පෙ.ව.10.00 |
| 28. | ගරු ප්‍රා.ස.ස. පී.එන්.එස්.ගුණවර්ධන මැතිතුමිය | පෙ.ව 10.00 |

**නොපැමිණි**

01. ගරු ප්‍රා.ස.ස. කේ.රන්ජන් වීරසේකර මැතිතුමා

**සහභාගී වූ නිලධාරීන්**

01. ලේකම් (වැ.බ) - එම්.දිනුජිත් රන්දූල මයා.

02. කළමනාකරණ සේවා නිලධාරි - චන්ද්‍රලේඛා ජයවික්‍රම මිය

**ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.**

ගරු සභාපතිතුමා ඇතුළු පැමිණි සිටි ගරු සභිකවරුන් සියළු දෙනා මෙන්ම සහභාගි වූ නිලධාරීන් ප්‍රථමයෙන් ආගම සිහි කරන ලදි. ඉන් පසු ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

සියළු දෙනාටම සුබ උදෑසනක්. සියළු දෙනාගෙන්ම අවසරයි. අද දින කටුවන ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ පෙබරවාරි මස මහ සභා රැස්වීම සඳහා සහභාගි වන ගරු උප සභාපතිතුමන්, හිටපු සභාපතිතුමන් , ගරු සභිකවරුන් සියළු දෙනාම ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එමෙන්ම සභා රැස්වීම සඳහා සහභාගි වන ලේකම් තුමා ඇතුළු නිලධාරීතුමියත් ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මින් ඉදිරියට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරමු යැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

## **01.පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම හා සංශෝධන ඉදිරිපත් කිරීම.**

2023 ජනවාරි මස 04 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සළකා සභා සම්මත කිරීම සුදුසු බවත්, සංශෝධන හෝ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදි.

ගරු ප්‍රා.ස.ස.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

නිහඬතාවයෙන් පෙනී යන්නේ තවදුරටත් පසුගිය සභා වාර්තාවේ සංශෝදන නොමැති බවයි. ඒ අනුව 2023 ජනවාරි මස මහා සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2023 ජනවාරි මස 04 වන දින පැවති සංශෝධිත මහ සභා රැස්වීමේ වාර්තාව සම්බන්ධව විරෝධතා නොමැති බැවින් සියළු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## **02.ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

## **03. ප්‍රාදේශිය සභාව අමතා එවා ඇති සංදේශ ,පෙත්සම් ,පැමිණිලි හා සන්නිවේදන - නැත**

## <u>04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -</u> නැත

## <u>05. යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>

### <u>05 – 1. පෙර පාසල් ගුරු හා පුස්තකාල සහායක තනතුරු පුරප්පාඩු සඳහා පිළියම් යෙදීම</u>

<u>**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**</u>

**පෙර පාසල් ගුරු හා පුස්තකාල සහායක තනතුරු පුරප්පාඩු සඳහා පිළියම් යෙදීම මැයෙන් පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1/10/02 හා 2023.01.10 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව පෙර පාසල් ගුරු හා පුස්තකාල සහායක තනතුරු පුරප්පාඩු සඳහා අලුතින් කාර්ය මණ්ඩලය බඳවා ගැනීමක් සිදු නොවන බැවින් පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් එම පුරප්පාඩු සඳහා පිළියම් යොදා ගැනිම** සුදුසු යයි යෝජනා කරමි.

01.පෙර පාසල් ගුරු හා පුස්තකාල සහායක නිළධාරින් විශ්‍රාම යාමට මාස 6 කටවත් ප්‍රථමව ඒ සඳහා පෙර සුදානම් සැලැස්මක් සකස් කිරීම
02.සභාවේ වෙනත් ස්ථානයක කිසියම් අතිරික්ත සේවකයින් සිටි නම් ඔවුන් අතරින් පෙර පාසල් ගුරු හෝ පුස්තකාල සහායක තනතුරු වලට යොදාගත හැකි පුද්ගලයින් ඉහත පුරප්පාඩු ස්ථානවල සේවයේ යොදවා පුරප්පාඩු තුලනය කිරීම
03.සභාවේ දිර්ඝ කාලින ආදායම් තත්වය කෙරෙහි හොඳින් අධ්‍යනය කිරීමෙන් පසුව අත්‍යවශ්‍යම පෙර පාසල් ගුරු හා පුස්තකාල සහායක තනතුරු කිහිපයක් පමණක් සභා අරමුදලින් වැටුප් ගෙවීමේ පදනම මත බඳවා ගැනීම
04.ඉහත 02 හා 03 පරිදි කටයුතු කිරීමට හැකියාවක් නොමැති අවස්ථා වලදී එසේ පුරප්පාඩු ඇති වූ පෙර පාසල හෝ ශාඛා පුස්තකාලය වසා දමා එහි තිබෙන සම්පත් ආසන්නයේම ඇති සභාව සතු වෙනත් පෙර පාසලකට හෝ පුස්තකාලයකට සම්බන්ධ කිරීමට කටයුතු කිරිම

ගරු ප්‍රා.ස.ස. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>**ගරු ප්‍රා.ස.ස.එම්.ඩී.සුගතදාස මැතිතුමා**</u>

ගරු සභාපතිතුමණි, අපේ ප්‍රාදේශිය සභාවල මෙම තනතුරු වල පුරප්පාඩු තියනවද? විශ්‍රාම යාම් ආදිය මත පෙර පාසල් ගුරුවරු ප්‍රමාණය අඩු වෙලාද?

<u>**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**</u>

ඔව්, අපි වෙනත් තනතුරු වල අය තමයි පෙර පාසල් ගුරුවරු ලෙස යොදා ගෙන තියෙන්නේ. මෙම ලිපියෙන් කියන්නෙත් ඒ කාරණයම තමයි. ඒ නිසා ඇතැම් විට වෙනත් තනතුරු වල අයට පෙර පාසල් ගුරු තනතුරට එන්න මේ මගින් අවස්ථාවක් ලැබේවි. අපි මේ සඳහා අනුමැතිය අරගෙන තියමු. ඉදිරියේදි අවශ්‍ය වුණොත් එවැනි අයට අවස්ථාව ලබා දෙමු. ඒත් එක්කම ඒ අය ප්‍රමාණවත් නොවුනොත් අලුතින් බඳවා ගැනිම සඳහා පූර්ව අනුමැතියක් අරගනිමු.

<u>**ගරු ප්‍රා.ස.ස.රමණී හල්පෙගමගේ මැතිතුමිය**</u>

ගරු සභාපතිතුමණි, කිරම පෙර පාසලෙහි එහෙම වෙනත් තනතුරු වල අය යොදවලා තියනවා නේද?

<u>**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**</u>

ඔව්, දැනට එහෙම අය යොදවලා තියෙනවා. එයාල කාලයක් තිස්සේ වැඩ කරලා පළපුරුදු අය.

ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභාවේ ඇතිවන පෙර පාසල් හා පුස්තකාල සහායක තනතුරු පුරප්පාඩු සඳහා කටයුතු කිරීමේදි **පෙර පාසල් ගුරු හා පුස්තකාල සහායක තනතුරු පුරප්පාඩු සඳහා පිළියම් යෙදීම මැයෙන් පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1/10/02 මැයෙන් 2023.01.10 දිනැති ලිපියට අනුව කටයුතු කිරීම** සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

**<u>05 – 2. කිරම නගරයේ ඉදිකර ඇති ලංකා බැංකුවේ ස්වයං බැංකු ඒකකය නොහොත් ස්වයංක්‍රිය මුදල් ලබා ගැනීමේ හා තැන්පත් කිරීමේ කුටිය සම්බන්ධවයි</u>**

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

කිරම නගරයේ ඉදිකර ඇති ලංකා බැංකුවේ ස්වයං බැංකු ඒකකය නොහොත් ස්වයංක්‍රිය මුදල් ලබා ගැනිමේ හා තැන්පත් කිරීමේ කුටිය සම්බන්ධවයි මැයෙන් අංක KPS/34/AC 02 හා **2023.02.03 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශිය සභාව මගින් කිරම නගරයේ ඉදිකර ඇති ලංකා බැංකුවේ ස්වයං බැංකු ඒකකයේ** වැඩ අවසන් **කිරීම 2021.08.05 දින සිදු කරනු ලැබුවත් එය විවෘත කිරීම 2022.02.10 දින සිදු කර ඇත. ඒ සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2023.01.19 දින ලැබී ඇති තක්සේරු වාර්තාව අනුව මාසික බදු කුලිය රු.10000.00ක් ලෙස තීරණය කර ඇති බැවින් ඉදිරිපත් කර ඇති ගිවිසුම් ප්‍රකාරව මෙම ස්වයං බැංකු ඒකකය විවෘත කළ දින සිට පෙරදාතම් කර ගිවිසුම් ගත වී එම බදු කුලිය අය කිරීමට කටයුතු කිරීම** සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ස.එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>**

දැනට ගිවිසුම් ගත වෙලා නැද්ද?

**<u>ගරු ප්‍රා.ස.ස.එච්.කේ.ඒ. ආනන්ද කුලසුන්දර මැතිතුමා</u>**

තවම අය කිරීම් කරලා නැති නිසා පරණ ගාස්තු සමග අය කිරීම් කරන්න වෙනවා නේද?

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

ගිවිසුම් ගත වෙන්න තක්සේරු දෙපාර්තමේන්තුවේ පරක්කුව තමයි තිබුණෙ. දැන් එම වාර්තාව ලැබිලා තියනවා. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තීරණය කරලා තියන මාසික කුලිය රු.10000.00ක්. ඒ අනුව එම කුටිය විවෘත කළ දින සිට ගිවිසුම් ගත වෙමු. එතන සිට ගාස්තු අය කරනවා.

**ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභාව මගින් කිරම නගරයේ ඉදිකර ඇති ලංකා බැංකුවේ ස්වයං බැංකු ඒකකයේ** වැඩ අවසන් **කිරීම 2021.08.05 දින සිදු කරනු ලැබුවත් එය විවෘත කිරීම 2022.02.10 දින සිදු කර ඇත.** බැවින් **ඒ සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2023.01.19 දින ලැබී ඇති තක්සේරු වාර්තාව අනුව මාසික බදු කුලිය රු.10000.00ක් ලෙස තීරණය කර ඇති බැවින් ඉදිරිපත් කර ඇති ගිවිසුම් ප්‍රකාරව මෙම ස්වයං බැංකු ඒකකය විවෘත කළ දින සිට පෙරදාතම් කර**

ගිවිසුම් ගත වී එම බදු කුලිය අය කිරීමට කටයුතු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 05 – 3. කැකිරිඕබඩ ජල ව්‍යාපෘතියේ විදුලි පරිපථය සකසා ගැනීම සම්බන්ධව

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

කැකිරිඕබඩ ජල ව්‍යාපෘතියේ විදුලි පරිපථය සකසාගැනීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 10/ජල හා 2023.02.04 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශිය සභාව වෙත පවරා ගන්නා ලද කැකිරිඕබඩ ජල ව්‍යාපෘතියේ ජල පොම්පාගාර වල විදුලි පරිපථ පමණක් පැවතීම නිසා හදිසි විදුලි ඇණ හිටීමකදී එහි අවධානම් තත්වයක් පවතින බැවින් මෙම ජල පොම්පාගාර දෙක සඳහා තාක්ෂණ නිළධාරි නිර්දේශය මත පැනල් බෝඩ් දෙකක් සහා අරමුදලින් සවි කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.ජේ.ඒ.ගාමිණි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මෙම ස්ථානයේ ස්වයංක්‍රියව ක්‍රියාත්මක වන පරිදි පැනල් බෝඩ් දෙකක් සවි කරන්න ඕන.

**ගරු ප්‍රා.ස.ස.එම්.ඩී.සුගතදාස මැතිතුමා**

අපි මේ ජල ව්‍යාපෘතිය පවරා ගත්තේ කවද ඉදන්ද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපි ජනවාරි මාසෙ වෙද්දි පවරා ගත්තා. දැනට අපිට බිල් ගෙවීම් කරනවා.

ඒ අනුව කැකිරිඕබඩ ජල ව්‍යාපෘතියේ ජල පොම්පාගාර වල විදුලි පරිපථ පමණක් පැවතීම නිසා හදිසි විදුලි ඇණ හිටීමකදී එහි අවධානම් තත්වයක් පවතින බැවින් මෙම ජල පොම්පාගාර දෙක සඳහා තාක්ෂණ නිළධාරි නිර්දේශය මත පැනල් බෝඩ් දෙකක් සහා අරමුදලින් සවි කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 05 – 4. 227-5163 ජල බවුසරය සම්බන්ධවයි

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

227-5163 ජල බවුසරය සම්බන්ධවයි මැයෙන් රියදුරු එස්.ජේ.ඒ.ගුණරත්න මයා විසින් 2023.02.03 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව එම ජල බවුසරය සඳහා ඕටර්නේටරයක් සවි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව තාක්ෂණික නිළධාරි වාර්තාවක් මත සහා අරමුදලින් ජල බවුසරය සඳහා ඕටර්නේටරයක් සවිකිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස ජේ.ඒ.ගාමිණි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ස. ජේ.ඒ.ගාමිණි මැතිතුමා**

අපි මේ අලුත්වැඩියාවන් කොහොමත් සිදු කරන්න අවශ්‍යයි. ඒ නිසා ඉක්මණින් කරමු.

ඒ අනුව 227-5163 ජල බවුසරය සඳහා තාක්ෂණික නිළධාරි වාර්තාවක් මත සහා අරමුදලින් ජල බවුසරය සඳහා ඕටර්නේටරයක් සවිකිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 05 – 5. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2023

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම - 2023 මැයෙන් අංක kps/16/සැපයුම් හා 2023.02.03 දිනැති ලිපියට අනුව 2023 වර්ෂයෙහි කටුවන ප්‍රාදේශිය සභාවෙහි සේවා සැපයීම සඳහා ඉල්ලුම් කර ඇති සැපයුම්කරුවන් හා සේවා සපයන්නන් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

සැපයුම් කරුවන් 46 දෙනෙකුගේ නාම ලේඛනයක් තියෙනවා. මේක සෑම වර්ෂයකම සිදු කරන කටයුත්තක්.ඒ අයගෙන් සුදුසු අය තෝරා ගෙන අවශ්‍ය සේවා ලබා ගැනීම් කරනවා.

ඒ අනුව 2023 වර්ෂයෙහි කටුවන ප්‍රාදේශිය සභාවෙහි සේවා සැපයීම සඳහා ඉල්ලුම් කර ඇති සැපයුම්කරුවන් හා සේවා සපයන්නන් සඳහා අනුමැතිය ලබා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 05 – 6. පාලම් බෝක්කුවක් සම්බන්ධවයි

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

පාලම් බෝක්කුවක් සම්බන්ධවයි මැයෙන් කිරම, එගොඩබැද්ද, පොල්වත්ත, රශ්මි සෙවණ ලිපිනයෙහි පදිංචි කේ.එල්.චන්ද්‍රිකා මිය විසින් 2023.02.02 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව පොල්වත්තේ සිට එගොඩවත්ත හේනෙහි නිවෙස් වලට යාමට ඇළ මාර්ගය හරහා සකස් කර ඇති ලී දඬුවලින් සකස් කරන ලද පාලම වෙනුවට පාලම් බෝක්කුවක් සකස් කර දෙන මෙන් ඉල්ලුම් කර ඇත. ඒ අනුව තාක්ෂණ නිළධාරි ඇස්තමේන්තුවක් මත එම පාලම් බෝක්කුව සකස් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.එච්.ඒ.ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා**

මෙය සකස් කරන්න අවශ්‍යයි. ඒ සඳහා ග්‍රාම නිළධාරිතුමන්ගේ නිර්දේශයත් ලැබිලා තියෙනවා. අපිට ප්‍රතිපාදන නොමැති කම තමයි තියෙන්නේ. කෙසේ නමුත් තාක්ෂණ නිළධාරි මගින් ඇස්තමේන්තුවක් සකස් කරන්න කියමු. ඉදිරියේදි ප්‍රතිපාදන ලැබෙන පරිදි සකස් කරන්න බලමු.

ඒ අනුව පොල්වත්තේ සිට එගොඩවත්ත හේනෙහි නිවෙස් වලට යාමට ඇළ මාර්ගය හරහා ලී දඬුවලින් සකස් කරන ලද පාලම වෙනුවට තාක්ෂණ නිළධාරි ඇස්තමේන්තුවක් මත පාලම් බෝක්කුවක් සකස් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 05 – 7. මිද්දෙනිය රාජපක්ෂ සුපරි වෙළද සංකීර්ණයේ අංක 21 සිට 25 දක්වා නව කඩ කාමර සහ දෙවන මහලෙහි හිග කඩ කුලී සම්බන්ධවයි

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මිද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළද සංකීර්ණයේ අංක 21 සිට 25 කඩ කාමර හා දෙවන මහල සම්බන්ධයි මැයෙන් වලව්වත්ත, ඉහළ බෙලිගල්ල, බෙලිගල්ල ලිපිනයෙහි පදිංචි විජේසිරි කුලතුංග මහතා විසින් 2023.01.25 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපියට අනුව ඔහු විසින් ලබා ගන්නා ලද කඩ

කාමර සඳහා ගෙවීමට ඇති හිග මුදල් සඳහා සහන කාලයක් ඉල්ලුම් කර ඇත. අදාළ ඉල්ලීම සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමන්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ස. ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, මේ අය අපිට හැමදාම වැඩ පටන් ගන්න බව කියනවා. නමුත් ඒක කරන්නේ නැහැ. හැමදාම අපිව රවට්ටනවා. ඒ නිසා මේක සභාවට පවරා ගන්න ක්‍රමයක් තියනවා නම් ඒක කරන්න. තවදුරටත් සහන ලබා දෙන එකේ තේරුමක් නැහැ.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

මේ සඳහා අපිට තීරණයක් ගන්න බැහැ. වෙනත් හම්බන්තොට, බෙලිඅත්ත නගර වල සාප්පු සංකීර්ණ සඳහා සහන ලබා දීලා තියනවා කියලා මේ ලිපි වලින් පෙන්වනවා. අපිත් මේ සම්බන්ධව තීරණයක් ගන්න ආණ්ඩුකාර තුමන්ට යවමු. මේ කඩ කාමර ලබා දිපු ක්‍රමවේදය පිළිබඳවත් විගණනය වෙලා තියෙන්නේ. ඒ පිළිබඳ දැන් හොයනවා. නමුත් ඒක සභාව මගින් කරපු දෙයක් නෙවෙයි.

**<u>ගරු ප්‍රා.ස.ස. එච්.කේ.ඒ.ආනන්ද කුලසුන්දර මැතිතුමා</u>**

සභාපතිතුමනි, මේ පාර්ශවය විසින් යම් යම් ඉදිකිරීම් කරන්නේ සභාවේ අනුමැතිය මතද? ඒක අනෙක් කඩ හිමියන්ට බාධාවක් නැද්ද? ඒත් එක්කම ඒ කඩ කාමර වල අතුරු බදු සම්බන්ධ ප්‍රශ්නයක් තියෙනවද?

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

ඒ සම්බන්ධව ගැටළුවක් නැහැ. එම ඉදිකිරීම් කරන්නෙ නැති එක තමයි ගැටළුව වෙලා තියෙන්නේ. පසුගිය දවස් වල විගණන නිළධාරින් ආපු වෙලාවෙ කඩ කාමර පරීක්ෂා කරන්න ගියා. අතුරු බදු දුන්න ඇතැම් අය පිළිබද තොරතුරු අනාවරණය වෙලා තිබුණා. අපිට ඒ සම්බන්ධව විස්තර දුන්නා. අපි ඒ අයට ලිඛිතව දන්වලා අවශ්‍ය කටයුතු කරනවා.

ඒ අනුව මිද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 21 සිට 25 කඩ කාමර හා දෙවන මහළ සම්බන්ධයි මැයෙන් වලව්වත්ත, ඉහළ බෙලිගල්ල, බෙලිගල්ල ලිපිනයෙහි පදිංචි විජේසිරි කුලතුංග මහතා විසින් ලබා ගන්නා ලද කඩ කාමර සඳහා ගෙවීමට ඇති හිග මුදල් සඳහා සහන කාලයක් ඉල්ලුම් කිරීම සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමන්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06. කාරක සභා වාර්තා</u>

### <u>06 – 1. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව -2023.01.18 වන දින</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

2023.01.18 වන දින පැවති මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අංක 01 සිට 93 දක්වා වු වවුචර් සඳහා ගෙවීම් කිරීම සුදුසු බවත් යෝජනා අංක 01 සිට 09 දක්වා ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා විසින් පැමිණ සිටි කමිටු සාමාජිකයින් පිළිගනිමින් මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව ආරම්භ කරන ලදී.

| අනු අංකය | නම | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|
| 1. | කේ.එස්.එස්.සී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,කටුවන | 53-1634 කැබ් රථය වාර සේවා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 23285.00 |
| 2. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | 2022 දෙසැම්බර් මස වරාපිටිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 12280.00 |
| 3. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | 2022 දෙසැම්බර් මස කිරම මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 13250.00 |
| 4. | ඩබ්.ඒ.දනිතා සුභාෂණී මිය,සෝමසිරි ස්ටෝර්ස්,හුංගම පාර,මිද්දෙනි ය | 2022 දෙසැම්බර් මස මිද්දෙනිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 12220.00 |
| 5. | ජේ.ඩිලාන් මයා,මිද්දෙනිය පාර,කටුවන | 2022 දෙසැම්බර් මස කටුවන මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 12670.00 |
| 6. | ජී.රශ්මි රවීනා මෙය,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස වරිපනම් ප්‍රතිශෝධන කටයුතුවලට සහය වීම වෙනුවෙන් ගෙවීම | 32000.00 |
| 7. | ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | ජල ගිණුමෙන් පොදු ගිණුමට මුදල් මාරු කිරීම | 500000.00 |
| 8. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2023 වර්ෂය සඳහා මිද්දෙනිය කාර්යාලය සඳහා සුළු මුදල් අග්‍රිම ලබා ගැනීම | 25000.00 |
| 9. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවේ නිළධාරයන්ට දිනකට දෙවරක් තේ පැන් ලබා දීමට අවශ්‍ය අත්තිකාරම් මුදලක් ලබා ගැනීම | 5000.00 |
| 10. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2023 වර්ෂය සඳහා කටුවන කාර්යාලය සඳහා සුළු මුදල් අග්‍රිම ලබා ගැනීම | 5000.00 |
| 11. | එම්.දිනුජිත් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7910.00 |
| 12. | එම්.දිනුජිත් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 නොවැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 3500.00 |
| 13. | එම්.දිනුජිත් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 7700.00 |
| 14. | එම්.ඒ.සාගරිකා මිය,කාර්යාල කාර්ය සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1540.00 |
| 15. | ඩබ්.ආර්.කුමාර මයා,තාක්ෂණ සේවා නිළධාරී , කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1550.00 |
| 16. | කේ.ජී.තිලිණි හර්ෂණී මිය, තාක්ෂණ සේවා නිළධාරී , කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1430.00 |
| 17. | ඒ.පී.ප්‍රියමාල් හංසන මයා,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 1182.00 |
| 18. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා, තාක්ෂණික සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස 22 ගමන් වියදම් ගෙවීම | 1134.00 |
| 19. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා, තාක්ෂණික සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස 21 ගමන් වියදම් ගෙවීම | 1150.00 |

| | | | |
|---|---|---|---|
| 20. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා, තාක්ෂණික සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස 27 ගමන් වියදම් ගෙවීම | 1410.00 |
| 21. | එස්.දූෂාන්ති මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ඔක්තෝම්බර් මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 22. | එස්.දූෂාන්ති මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 නොවැම්බර් මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 23. | එම්.කේ.ටී.චතුරිකා මිය, ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 නොවැම්බර් මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 24. | කේ.එරංග රවිශාන් මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5180.00 |
| 25. | එම්.කේ.ටී.චතුරිකා මිය, ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 3100.00 |
| 26. | එස්.දූෂාන්ති මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 4000.00 |
| 27. | කේ.පී.ආර්.සඳරුවන් මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 3120.00 |
| 28. | ඒ.පී.ප්‍රියමාල් හංසන මයා,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 3550.00 |
| 29. | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා, තාක්ෂණික සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 3850.00 |
| 30. | ඩබ්.ආර්.කුමාර මයා,තාක්ෂණ සේවා නිළධාරී , කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5500.00 |
| 31. | කේ.ජී.තිලිණි හර්ෂණී මිය, තාක්ෂණ සේවා නිළධාරී , කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5250.00 |
| 32. | ඒ.වී.පී.යමුනා නිල්මිණී මිය, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 5710.00 |
| 33. | කේ.ජී.අනුර මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 6200.00 |
| 34. | ඩබ්.සුභාෂණී මිය, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 3600.00 |
| 35. | කේ.සී.සංජීව මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 2000.00 |
| 36. | සේනක ඉරේෂාන් මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 නොවැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 3750.00 |
| 37. | සේනක ඉරේෂාන් මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7500.00 |
| 38. | ඒ.ජේ.සුරංග පුෂ්පකුමාර මයා,කාර්යාල කාර්ය සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2284.00 |
| 39. | බී.ඒ.සමන් කුමාර මයා,වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 9548.00 |
| 40. | ඩබ්.පී.ආර්.ධර්මරාජික මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 16560.00 |
| 41. | ජී.එම්.නිහාල් චමින්ද මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 10072.00 |

| | | | |
|---|---|---|---|
| 42. | කුමාර පලිහක්කාර මයා, ,බැකෝ සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2921.00 |
| 43. | දිමුතු සුරංග මයා,ජල සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8515.00 |
| 44. | ජනක පුෂ්පකුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8083.00 |
| 45. | එස්.වසන්ත කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 13135.00 |
| 46. | රොෂාන් ඉන්ද්‍රජිත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7472.00 |
| 47. | සමීර සම්පත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8166.00 |
| 48. | ජේ.එස්.චන්ද්‍රසිරි මයා,මාර්ග කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 10316.00 |
| 49. | සරත් ලියනගේ මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8166.00 |
| 50. | කේ.ජී.සුජිත් මයා,විදුලි කාර්මික, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8956.00 |
| 51. | එස්.ජේ.චන්දන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 6213.00 |
| 52. | එම්.අමරහේරත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 3435.00 |
| 53. | වයි.වී.දයානන්ද මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8083.00 |
| 54. | එම්.ඒ.සුගත් තිලක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2526.00 |
| 55. | එස්.පී.අමිල සම්පත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7224.00 |
| 56. | කේ.කේ.පුණ්‍යාවතී මිය, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2924.00 |
| 57. | කේ.කේ.රංජනී මිය, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2815.00 |
| 58. | කේ.රූපසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 3400.00 |
| 59. | සුජ්පා වඩ්වෙල් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 9249.00 |
| 60. | කේ.වී.පතිනායක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2898.00 |
| 61. | කේ.කේ.නාලක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 12390.00 |
| 62. | ප්‍රියන්ත ඒකනායක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7194.00 |
| 63. | කේ.ටී.එම්.රුචිර ප්‍රියංකර මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 8583.00 |
| 64. | ඒ.කේ.ඒ.ක්‍රිෂාන්ත මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 7621.00 |

| | | | |
|---|---|---|---|
| 65. | මුදල් භාරකරු, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම(2023.01.02 සිට 2023.01.09 දක්වා) | 5670.00 |
| 66. | ලේකම්, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවට අයත් බස් නැවතුම්පොළෙහි ගලිවල ඉවත් කිරීම වෙනුවෙන් ගලි බවුසර් රථය සඳහා ගෙවීම් කිරීම | 14250.00 |
| 67. | ආර්.ජී.නුවන් ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 11194.75 |
| 68. | ජේ.ඒ.රංජිත් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 11194.75 |
| 69. | අයි.සුනිල් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 11194.75 |
| 70. | කීර්ති අබේනායක මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 11194.75 |
| 71. | එම්.ඒ.චමින්ද කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 4241.50 |
| 72. | කේ.කේ.ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 4241.50 |
| 73. | කේ.සී.සංජීව මයා,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 4000.00 |
| 74. | කේ.ආර්.නිශාන්ත මයා, බිගෝලි වයිනීස් හොටෙල්,මිද්දෙනිය | 2022.12.16 දින පැවති විගණන කළමනාකරණ කමිටුවට සංග්‍රහ ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 9270.00 |
| 75. | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 2022 IV වන කාර්තුව සඳහා මුද්දර බදු මුදල් ප්‍රේෂණය කිරීම | 42900.00 |
| 76. | එම්.පී.අමරසේන මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 නොවැම්බර් මස ජල බිල් 2023.01.11 දිනට බෙදා අවසන් කිරීම වෙනුවෙන් ලබා දෙන ඉන්ධන දීමනාව ගෙවීම | 1850.00 |
| 77. | ඩබ්.ඒ.වසන්ත මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 නොවැම්බර් මස ජල බිල් 2023.01.11 දිනට බෙදා අවසන් කිරීම වෙනුවෙන් ලබා දෙන ඉන්ධන දීමනාව ගෙවීම | 1850.00 |
| 78. | ඕ.ඩී.ඩී.චමිල් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 නොවැම්බර් මස ජල බිල් 2023.01.11 දිනට බෙදා අවසන් කිරීම වෙනුවෙන් ලබා දෙන ඉන්ධන දීමනාව ගෙවීම | 1850.00 |
| 79. | දඹේතලාව ගොවි සංවිධානය, දඹේතලාව ,මිද්දෙනිය | දෙනියවැව පාර කපා සකස් කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම<br>• 10% රඳවුම් මුදල-රු25000.00 | 225000.00 |
| 80. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කිරම උප කාර්යාල සඳහා සුළු මුදල් ලබා ගැනීම | 5000.00 |
| 81. | නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 9136.00 |
| 82. | නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 16100.00 |
| 83. | අයි.ජී.මහින්ද මැතිතුමා,සභාපති, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 18000.00 |

| | | | |
|---|---|---|---|
| 84. | කේ.එස්.එස්.සී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,කටුවන | PF-7414 කැබ් රථය වාර සේවා කිරීම වෙනුවෙන් ගෙවීම | 34270.00 |
| 85. | සාමාන්‍යාධිකාරී,ශ්‍රී ලංකා දුම්රිය සේවය | දුම්රිය බලපත්‍ර සඳහා මුදල් ගෙවීම(ඉන්වොයිස් අංක 2022761609 හා 2022 සැප්තැම්බර් මස) | 8700.00 |
| 86. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය රක්ති කිරිපිටි පැකට් 03(400g) හා සීනි 2Kg මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 4180.00 |
| 87. | මුදල් භාරකරු, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම (2023.01.09 සිට 2023.01.16 දක්වා) | 17280.00 |
| 88. | කේ.ජී.තිළිණි හර්ෂණී මිය,තාක්ෂණ සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | මිද්දෙනිය බටහිර ඉසුරු මාවතේ සිට සමගි මාවත දක්වා මාර්ගය සංවර්ධනය කිරීම හා අඹකොළගොඩ පාර ජනසවි මාවත ප්‍රජා ශාලාව පිහිටි මාර්ගය කපා සංවර්ධනය කිරීමට අදාළ පරිපාලන වියදම් ලබා ගැනීම | 6802.90 |
| 89. | එම්.චම්පිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 90. | එස්.දූෂාන්ති මිය, ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 91. | කේ.ආර්.නිශාන්ත මයා, බිගෝලි චයිනීස් හොටෙල්,මිද්දෙනිය | 2023.01.04 දින පැවති මහා සභාවට සහභාගී වූ මහජන නියෝජිතයින් ඇතුළු පිරිසට සංග්‍රහ ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 38880.00 |
| 92. | සී/ස ගුණවර්ධන සහ (පුද්) සමාගම,මහ වීදිය,අම්බලන්තොට | කටුවන ප්‍රාදේශීය සභාවේ ගබඩාවට අවශ්‍ය කාර්යාලීය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 70480.00 |
| 93. | සාමාන්‍යාධිකාරී, සී/ස වි.සේ.සමුපාකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සඳහා 2022.12.20 සිට 2022.12.31 දක්වා ඉන්ධන බිල<br>• RE-9230- ඩීසල් 80L<br>• 227-5870 - ඩීසල් 307L<br>• RC- 5539- ඩීසල් - 23L<br>• 227-5870- ඩීසල් - 83L<br>• PF – 7414 - ඩීසල් 271 L<br>• RD- 4364- ඩීසල් - 40L<br>• ZA-2978- ඩීසල් - 340L<br>• RB- 3498 - ඩීසල් 40 L<br>• RE-8995- ඩීසල් 35L<br>• 53-1634- ඩීසල් 95L<br>• LK – 9589 - ඩීසල් 85L<br>• BAK – 9907- පෙට්‍රල් - 10L | 587080.00 |

ඉහත වවුචර් අංක 01 සිට 93 දක්වා වූ වවුචර් ගෙවීම් කිරීමට සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ නිර්දේශ විය.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ දී ඉදිරිපත් වූ යෝජනා පහත පරිදි වේ.

1) සභාව සතු පහත වාහන සඳහා බැටරි අවශ්‍ය බව රියදුරු මහතුන් විසින් දන්වා ඇත.ඒ අනුව පහත සඳහන් වාහන සඳහා බැටරි මිලදී ගැනීමට සුදුසු බව යෝජනා විය.
    - 252-6508-90 Am 1 ක්

- LK-9589-120 Am ක්
- 227-5870-90 Am 1 ක්
- LL-6446 100 Am 1 ක්

2) ගිණුම් කටයුතු වෙනුවෙන් ලබා දී ඇති පරිගණක මෘදුකාංග කටයුතු කිරීමට පරිගණකයට අන්තර්ජාල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා wi-fi adapter එකක් හා එම පරිගණකයේ UPS බැටරියද අක්‍රිය වී ඇති බැවින් ඒ සඳහාද නව UPS බැටරියක් ලබා දෙන මෙන් ගිණුම් විෂය මගින් දන්වා ඇත.ඒ අනුව wi-fi adapter එකක් හා UPS බැටරියක් ලබා දීම සුදුසු බව යෝජනා විය.
3) කප්‍රාස 06/ආදායම් I විෂය භාවිතා රාජකාරී කටයුතු සඳහා භාවිතා කරනු ලබන පරිගණකයෙහි UPS බැටරියද අක්‍රිය වී ඇති බැවින් ඒ සඳහාද නව UPS බැටරියක් ලබා දෙන මෙන් එම විෂය මගින් දන්වා ඇත. ඒ අනුව හා UPS බැටරියක් ලබා දීම සුදුසු බව යෝජනා විය.
4) කටුවන ප්‍රාදේශීය සභාවේ මිද්දෙනිය කාර්යාලයෙහි දැනට පවතින කසල බඳුන් අබලන්ව ඇති බැවින් නව කසල බඳුන් 04 ක් ද,කාර්යාලය තුළ පා පිස දැමීම සඳහා අවශ්‍ය කාපට් 10 ක් ලබා දීමට සුදුසු බව යෝජනා විය.
5) කටුවන ප්‍රාදේශීය සභාව සතු හෙල්ලල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයෙහි කම්බි වැට මේ වන කැඩී ඇති බව විෂය භාර නිළධාරී විසින් දැනුම් දී ඇත.ඒ අනුව ග්ලිරිසීඩියා වැනි ද්‍රව්‍යයක් යොදා ගෙන ඉනි වැටක් ඉදි කර ප්‍රතිපාදන අවශ්‍යතාවය සපුරා ගෙන ස්ථිර වැටක් ඉදි කර දීමට සුදුසු යැයි යෝජනා විය.
6) කටුවන ප්‍රාදේශීය සභාවේ මිද්දෙනිය කාර්යාලයෙහි භාවිතා කරනු ලබන PC-065397 හා PC -065398 දරන ඡායා පිටපත් යන්ත්‍ර දෙක ක්‍රියා විරහිත වී ඇති බවත් ඒ බව සේවා නියෝජිත ආයතනය වෙත දැනුවත් කළ විට එමගින් ඡායා පිටපත් යන්ත්‍ර සඳහා සවි කළ යුතු උපාංග ඇතුලත් ඇස්තමේන්තු ලබා දී ඇති බවද විෂය භාර නිළධාරී විසින් දැනුම් දී ඇත.එම ඇස්තමේන්තුව අනුව ඡායා පිටපත් යන්ත්‍ර සැකසීම සුදුසු බව යෝජනා විය.
7) කටුවන ප්‍රාදේශීය සභාවේ කිරම උප කාර්යාලයෙහි භාවිතා කරනු ලබන PC-066714 දරන ඡායා පිටපත් යන්ත්‍රය සඳහා සේවා ගිවිසුම අළුත් කිරීම අවශ්‍ය බව එම ආයතනය මගින් දන්වා ඇති බවද ඒ අනුව 2023.02.14 සිට 2024.02.13 දක්වා කාල සීමාවට රු 19896.01 (වැට් සහිතව)ක මුදල ගෙවීමට සිදු වන බව විෂය නිළධාරී විසින් දැනුම් දී ඇත.ඒ අනුව එම මුදල ගෙවීමට සුදුසු බව යෝජනා විය.
8) 227-5870 වැන් රථයේ රියදුරු විසින් 195-14 ප්‍රමාණයේ ටයර් 04 ක් අළුතින් යෙදීමට අවශ්‍ය බව දැනුම් දී ඇති අතර එය ලබා දීම සුදුසු බව යෝජනා විය.
9) කිරම නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට හා දෙහිගහහේන ජංගම ආයුර්වේද බෙහෙත් ශාලාවට 2023 වර්ෂයේ පළමු කාර්තුව සඳහා ඖෂධ ලබා ගැනීමට අවශ්‍ය බව එහි වෛද්‍ය නිළධාරී විසින් දැනුම් දී ඇති අතර එම ඖෂධ ලබා ගැනීම සුදුසු බව යෝජනා විය.

ගරු ප්‍රා.ස.ස. ආරියරත්න ඒකනායක මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව අංක 01 සිට 93 දක්වා වු වවුචර් ගෙවීම සම්බන්ධවත් අංක 01 සිට 09 දක්වා යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06 – 2. මාසික වෙළදපොළ ආදායම් වියදම් වාර්තාව - 2022 දෙසැම්බර් මස</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022 වර්ෂයේ දෙසැම්බර් මස මහ සභාව සතු සියළු වෙළද පොළවල් , මිද්දෙනිය පොළ තුළ පිහිටි වෙළද කුටිවලින් හා මිද්දෙනිය පැරණි පොළ මාළු ලැලි මගින් රු.578 920.00ක් ලබා ඇති අතර , පොළ ආදායමෙන් මෙම මස 10% කොමිස් මුදල් හා පොළ ව්‍යාපෘති දිමනා වෙනුවෙන් රු. 63 262.00 ක මුදලක් දරා ඇති බැවින් ශුද්ධ ආදායම රු.515 658.00 ක් වන අතර මෙම වෙළදපොළ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 දෙසැම්බර් මස වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 3 .ඉන්ධන වැයවීම් පිළිබඳ වාර්තාව - 2022 දෙසැම්බර්

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

සභාව සතු යන්ත්‍රෝපකරණ හා වාහන සදහා දෙසැම්බර් මස රු.1647425.00 ක ඉන්ධන සපයා ඇත. මෙම ඉන්ධන වියදම් වාර්තා සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. පී.කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ස. එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා**

සභාපතිතුමණි, මේ ඉන්ධන වාර්තාවේ ඔබතුමාගේ PF 7414 කැබ් රථයට සහ 252-6508 කැබ් රථයට විශාල වශයෙන් ඉන්ධන සදහා වැය කරලා තියෙනවා.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඔව්. මට බල ප්‍රදේශය තුළ ධාවනය සදහා මසකට ඉන්ධන ලීටර් 450ක් ලැබෙනවා. බල ප්‍රදේශයෙන් පිටත අවශ්‍ය තරම් ධාවනය කරන්න පුළුවන්. ඒත් එක්කම මම මේ නිළ වාහනය මගේ පෞද්ගලික පරිහරණය සදහා යොදා ගන්නව නම් ඒ සදහා ගෙවිය යුතු ගාස්තුත් ගෙවා තියෙනවා. අනෙක් කාරණය 252-6508 කැබ් රථය අපි ලේකම් මහත්තයාගේ රාජකාරි කටයුතු වලට අමතරව සභාවේ නිළධාරින්ගේ මාර්ග පරීක්ෂා ආදි විවිධ රාජකාරි වලට වගේම පසුගිය මාසයේ විගණන නිළධාරින්ගේ ස්ථාන පරීක්ෂා කිරීමේ රාජකාරි සදහා යෙදෙව්වා. ඒ නිසා ඉන්ධන වියදමේ යම් ඉහළ යාමක් සිදු වෙන්න ඇති.

ඒ අනුව 2022 දෙසැම්බර් මස ඉන්ධන වියදම් වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොමැති බැවින් සියලු සභිකවරුන්ගේ එකගතාවය මත සභා සම්මත කරන ලදී.

## 06 - 5 .ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව - 2022 නොවැම්බර් මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022 නොවැම්බර් මාසයට අදාළ ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව අනුව සමස්ත ආදායම රු: 2 398 222.00 වන අතර මාසික වියදම රු.1 160 053.99ක් වේ. ඒ අනුව මාසික ලාභය රු: 1 238 168.01කි. ඒ අනුව නොවැම්බර් මාසයට අදාළ ජල විශ්ලේෂණ වාර්තා සභාවේ අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 නොවැම්බර් මස ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තා සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 - 6. ජල ව්‍යාපෘතියේ මාසික ජල හිඟය අඩු වැඩි වීම - 2022 නොවැම්බර් මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

කටුවන ප්‍රාදේශීය සභාව සතු ජල ව්‍යාපෘතියට අදාළව මාසික ලැබීම් සහ හිඟ මුදල් සම්බන්ධව වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2022 නොවැම්බර් මස වන විට ආරම්භක හිඟය රු: 6418184.08

වන අතර ජූලි මස අවසාන හිඟය රු: 5180015.57ක් වේ. ඒ අනුව හිඟයේ වෙනස රු: 1238168.51ක් වන අතර හිගය අඩු වී ඇත. මෙම වාර්තාව සහා සම්මත කර ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව ජල ව්‍යාපෘතියේ 2022 නොවැම්බර් මස මාසික ජල හිඟය අඩු වැඩි වීමේ වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 07. බැංකු සැසඳුම්, ප්‍රා.ස 14,16,07 වාර්ථා

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

සභාව මගින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් බැංකු ගිණුම්වල ශේෂයන් හා ප්‍රා.ස 14,16 ,07 ආදායම් අයකර ගැනීම හා හිග ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය සහා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

- බැංකු සැසඳුම් වාර්තා.
  1. 265-1-001-7-7876593- ජල ව්‍යාපෘති ගිණුම
  2. 0077187171- මෙහෙයුම් හා නඩත්තු ගිණුම
  3. 0072633606- කර්මාන්ත ගිණුම
  4. 265-1-001-3-0020439- සේවක ණය ගිණුම
  5. 265-1-001-9-7876587- පොදු අරමුදල් ගිණුම
  6. 265-1-001-2-7876595- පොළ ව්‍යාපෘති ගිණුම
- 2022 දෙසැම්බර් මස ප්‍රා.ස. 16 ,14,07 වාර්තා

ගරු ප්‍රා.ස.ස.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022 දෙසැම්බර් මස ගෙවීම් හා බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රා.ස.16,14,07 වාර්තා සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08. වෙනත් යෝජනා
## 08-1. රාජපක්ෂ සුපිරි වෙළද සංකීර්ණයේ විදුලි මීටර් පද්ධතිය වෙනස් කිරීම
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

රාජපක්ෂ සුපිරි වෙළද සංකීර්ණයේ විදුලි මීටර් පද්ධතිය වෙනස් කිරීම මැයෙන් අංක කප්‍රාස 21 හා 2023.01.25 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව මිද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළද සංකීර්ණයේ විදුලිය ලබා දෙන මීටර් පද්ධතිය අනාරක්ෂිත බව විදුලි බල මණ්ඩලය විසින් දැනුම් දී ඇති බව දන්වා ඇත. ඒ අනුව තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත එම මීටර් පද්ධතිය සුරක්ෂිත ස්ථානයක සවි කිරිමට මේන් වයර් මීටර් 50ක ප්‍රමාණයක් අවශ්‍ය බව දන්වා ඇති බැවින් එම වයර් සහා අරමුදලින් ලබා දිම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි ළග මේන් වයර් නොමැති නිසා අවශ්‍ය පරිදි බලලා අරගෙන දෙමු.

**<u>ගරු ප්‍රා.ස.ස. ඩබ්.එච්.ඒ සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>**

ඔව්, සභාපතිතුමණි, එම ස්ථානය ඉතාමත් අනාරක්ෂිතයි. ඒ නිසා ඉක්මණින් මේ මීටර් පද්ධතිය සුරක්ෂිත ස්ථානයක සවිකරන්න කටයුතු කරන්න.

ඒ අනුව රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ විදුලි මීටර් පද්ධතිය සුරක්ෂිත ස්ථානයක සවි කිරිමට මේන් වයර් මීටර් 50ක ප්‍රමාණයක් අවශ්‍ය බව දන්වා ඇති බැවින් තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත එම වයර් සහා අරමුදලින් ලබා දිම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## <u>08-2. උලහිටියාව අමුදමන පාලම ඉදිකිරීම සම්බන්ධවයි</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

උලහිටියාව අමුදමන පාලම ඉදිකිරීම මැයෙන් අංක කප්‍රාස 07 හා 2022.02.07 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2021 පළාත් නිශ්චිත සංවර්ධන සැලැස්ම යටතේ ලැබු ප්‍රතිපාදන වන රු. 5 450 000.00ක මුදලින් පළමු අදියරේ සිදුකරන ලද ඉදිකිරීම් සඳහා ගෙවීම් කරනු ලැබුවේ රු.4 204 454.86 ක මුදලක් වන අතර 2022 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය අවිච්ඡේද නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත් කරු විසින් ඉදිරිපත් කර ඇති ඉතිරි රු. 592275.24ක බිල්පත සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ගෙවීම් කිරීමට නොහැකි බව දන්වා ඇති බව සඳහන් කර ඇත. මෙම සංවර්ධන කටයුත්ත අවසන් නොකර නතර කිරීම හේතුවෙන් මහ ජනතාවට සිදු වන අපහසුතාවය පිළිබඳ සළකා බලා මෙහි ඉතිරි සංවර්ධන කටයුතු සිදු කළ බැවින් මෙම ඉතිරි මුදල කොටස් වශයෙන් සහා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. ජේ.ඒ. ගාමිණි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් තුමා දැනුවත් කළා. නමුත් 2022 වර්ෂය සඳහා අවිජ්ඡේද නොකළ නිසා ගෙවීම් කළ නොහැකි බව එතුමන් දන්වා තිබෙනවා. නමුත් අපි ටෙන්ඩර් දීලා සභාව සමග ගිවිසුම් ගත වෙලා මේ සංවර්ධන කටයුත්ත කරලා තියෙන්නේ. ඒ නිසා අපි මේ ඉතිරි මුදල කොටස් වශයෙන් සහා අරමුදලින් ගෙවමු. අපිට පුළුවන් වුණොත් ප්‍රතිපාදනයක් වෙන් කර ගනිමු.

ඒ අනුව 2021 පළාත් නිශ්චිත සංවර්ධන සැලැස්ම යටතේ ලැබු ප්‍රතිපාදන වන රු. 5450000.00ක මුදලින් පළමු අදියරේ සිදුකරන ලද ඉදිකිරීම් සඳහා ගෙවීම් කරනු ලැබුවේ රු.4204454.86 ක මුදලක් වන අතර 2022 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය අවිච්ඡේද නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත් කරු විසින් ඉදිරිපත් කර ඇති ඉතිරි රු. 592275.24ක බිල්පත සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් ගෙවීම් කිරීමට නොහැකි බව දන්වා ඇති බැවින් මෙම මුදල කොටස් වශයෙන් සහා අරමුදලින් ගෙවීම් කිරීම සම්බන්ධව සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## <u>08-3 ගබඩාව වෙත ද්‍රව්‍ය මිලදී ගැනීම</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

ගබඩාව වෙත ද්‍රව්‍ය ලබා ගැනීම මැයෙන් ගබඩා භාරකරු කේ.පී.රුමේෂ් මහතා විසින් 2023.02.03 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2023 වර්ෂය සඳහා ගබඩාව වෙත අවශ්‍ය පහත ද්‍රව්‍ය මිල කැදවීම් කර සහා අරමුදලින් මිලදී ගැනීම සුදුසු **යයි යෝජනා කරමි.**

| අ.අ | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|

| | | |
|---|---|---|
| 01 | Photo paper | Pkt 05 |
| 02 | Binding tape (Black) | 30 |
| 03 | Campus file (Black) | 06 |
| 04 | Transparent Sheet | 50 |
| 05 | Letter head book (A4) | 50 |
| 06 | Letter head book (A5) | 50 |
| 07 | 1" සුදු සෙලෝටේප් | 20 |
| 08 | පිටු 160 CR පොත් | 40 |
| 09 | පිටු 40 CR පොත් | 20 |
| 10 | කතුරු | 10 |
| 11 | Toshiba 2309P Toner | 05 |
| 12 | ටිපෙටිස් | 15 |
| 13 | පිටු 80 CR පොත් | 40 |
| 14 | පිටු 120 CR පොත් | 40 |
| 15 | Stepler කටු පෙට්ටි | 50 |
| 16 | 9x4 ලියුම් කවර | 1000 |
| 17 | 2" සුදු සෙලෝටේප් | 20 |
| 18 | 12" අඩිරූල් | 10 |
| 19 | වැය ලේඛන | 05 |
| 20 | ප්‍රධාන ලෙජර් | 02 |
| 21 | ලිපි ගොණු ලේඛණ | 03 |
| 22 | පැමිණීමේ ලේඛන | 04 |
| 23 | බලපත්‍ර ගාස්තු ලේඛන | 05 |
| 24 | ජල ලේඛන | 08 |
| 25 | සබන් | 300 |
| 26 | ඉදල් | 60 |
| 27 | විම් කැට | 20 |
| 28 | කොසු | 10 |
| 29 | හාපික් | 20 |
| 30 | ග්ලාස් ක්ලීනර් | 05 |
| 31 | බන්ඩල් ක්ලිප් | 50 |
| 32 | වයර් කොයිල් | 20 |
| 33 | 6 x ½ pvc සැඩල් | 05 |
| 34 | ජල මීටර් | 300 |
| 36 | ½" pvc බට | 100 |
| 37 | 1" pvc බට | 20 |
| 38 | 1 ½" pvc බට | 20 |
| 39 | ½" Elbo | 100 |
| 40 | ½" Endcap | 50 |
| 41 | ½" T socket | 30 |

ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**</u>

ගබඩාවට අවශ්‍ය උපකරණ අපි අරගෙන දෙමු.

ඒ අනුව 2023 වර්ෂය සඳහා ගබඩාව වෙත අවශ්‍ය පහත ද්‍රව්‍ය මිල කැඳවීම් කර සහා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08- 4 .මිද්දෙනිය මහජන පොළෙහි සංවර්ධන කටයුතු සම්බන්ධව

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මිද්දෙනිය මහජන පොළ අලුත්වැඩියා කිරීම සම්බන්ධව අංක කප්‍රාස 09 හා 2023.02.06 දිනැති ලිපියට අනුව මිද්දෙනිය මහජන පොළෙහි සිදුවන විවිධ අපචාර ක්‍රියාවන් සහ සභා දේපල වලට සිදුවන හානි හේතු කර ගෙන එහි මාළු පොළට ඇතුළුවන ස්ථානයට අලුතින් ගේට්ටුවක් සවි කර ගැනීම හා දැනට පවතින ගේට්ටු 03 අළුත්වැඩියා කිරීම හා පොළ වටා ඇති දැල් වැටේ කැඩී ගිය ස්ථාන සකස් කිරීමට අවශ්‍ය බව දන්වා ඇත. ඒ සඳහා තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත සභා අරමුදලින් අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ස. ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා.**

ඔව්, සභාපතිතුමණි මේ ස්ථානය මමත් පරීක්ෂා කළා. ගොඩක් අය අයුතු ක්‍රියාවන් සඳහා මෙම ස්ථානය යොදා ගන්නවා. පෞද්ගලික පන්ති සඳහා පැමිණෙන ළමයි මෙම ස්ථානයේ ඉන්නවා. ඒකත් හොඳ දෙයක් නෙමෙයි. ඒ නිසා අපි ගේට්ටුවක් දාලා පොළට ඇතුළු වන ස්ථානය ක්‍රමවත්ව වසා තබමු.

**ගරු ප්‍රා.ස.ස. ජේ.ඒ.ගාමිණි මැතිතුමා.**

ඒත් එක්කම අභිකුණ්ඨක මිනිස්සු ආවමත් මේ පොළේ තමයි ඉන්නේ. ඒ අය පොළ අපිරිසිදු කරනවා. ඒ නිසා ආරක්ෂිත ගේට්ටුවක් සවි කරන එක හොඳයි.

ඒ අනුව මිද්දෙනිය මහජන පොළ මාළු පොළට ඇතුළුවන ස්ථානයට අලුතින් ගේට්ටුවක් සවි කර ගැනීම හා දැනට පවතින ගේට්ටු 03 අළුත්වැඩියා කිරීම හා පොළ වටා ඇති දැල් වැටේ කැඩී ගිය ස්ථාන සකස් කිරීම සඳහා තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත සභා අරමුදලින් අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-5. මිද්දෙනිය පොදු වැසිකිළියේ වහළ සැකසීම

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මිද්දෙනිය බස් නැවතුම්පොළ පොදු වැසිකිළියේ වහල සැකසීම මැයෙන් අංක KPS 30 හා 2023.02.08 දිනැති ලිපියට අනුව එම පොදු වැසිකිළියෙහි වහළය සැකසීම සඳහා තාක්ෂණ නිළධාරි මගින් ඇස්තමේන්තුවක් සකස් කර සභා අරමුදලින් අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. එච්.ඒ.ගාමිණි සංජීව මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව මිද්දෙනිය පොදු වැසිකිළියෙහි වහළය සැකසීම සඳහා තාක්ෂණ නිළධාරි මගින් ඇස්තමේන්තුවක් සකස් කර සභා අරමුදලින් අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-06. ජල සම්බන්ධතා අලුත් කිරීම- කැකිරිඕබඩ ප්‍රජා ජල ව්‍යාපෘතිය

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

නව ජල සම්බන්ධතා ගාස්තු සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 10/ජල හා 2023.02.08 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශිය සභාවට පවරා ගන්නා ලද කැකිරිඕබඩ ජල ව්‍යාපෘතියේ ජල පාර්භෝගික සමිතිය මගින් ජල සම්බන්ධතා ඔවුන්ගේ ඉල්ලීම අනුව විසන්ධි කිරීම් සිදු කර ඇති ජල සමිතියේ සාමාජිකයන්ව සිට ඇති තවත් ඉල්ලුම්කරුවන් 10 දෙනෙකු සඳහා මුලින් බඳවා ගන්නා අය සඳහා අය කරනු ලැබූ රු. 1500.00 ක ගිවිසුම් ගාස්තුව අය කර ජල සම්බන්ධතාවය ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. ආරියරත්න ඒකනායක මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ස. එම්.ඩී.සුගතදාස මැතිතුමා**

දැනට අපි ජල ව්‍යාපෘතියෙහි පවරා ගැනීම් කරලද?

**ගරු ප්‍රා.ස.ස. ආරියරත්න ඒකනායක මැතිතුමා**

එම ජල පාරිභෝගිකයින්ට නැවත ජල සම්බන්ධතාවය ලබා දීම පිළිබඳ සාධනිය මට්ටමක පවතී නම් අපි ලබා දෙමු.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි ජනවාරි මාසයේ පමණ ගිවිසුම් ගත වෙලා මේ පවරා ගැනීම් කළා. ඒ වන විට යම් යම් ගැටළු හේතුවෙන් ජලය විසන්ධි කිරීම් කර ඇති ජල පාරිභෝගියන් 10 දෙනෙක් පමණ සභාව මගින් ජල ව්‍යාපෘතිය කර ගෙන යාමත් සමග නැවත ජල සම්බන්ධතාවය ලබා දෙන්න කියලා ඉල්ලුම් කරලා තියෙනවා. අපි ඒ අයටත් ගිවිසුම් ගත වෙලා ඒ ගාස්තු ගෙවලා නැවත සම්බන්ධතාවය ලබා දෙන්න බලමු.

ඒ අනුව කැකිරිඕබඩ ජල ව්‍යාපෘතියේ ජල පාර්භෝගික සමිතිය මගින් ජල සම්බන්ධතා ඔවුන්ගේ ඉල්ලීම අනුව විසන්ධි කිරීම් සිදු කර ඇති ජල සමිතියේ සාමාජිකයන්ව සිට ඇති තවත් ඉල්ලුම්කරුවන් 10 දෙනෙකු සඳහා මුලින් බඳවා ගන්නා අය සඳහා අය කරනු ලැබූ රු. 1500.00 ක ගිවිසුම් ගාස්තුව අය කර ජල සම්බන්ධතාවය ලබා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-7. ව්‍යාපාරික ස්ථානවල ජල බිල් ව්‍යාපාරික ජල බිල් ලෙස නිකුත් කිරීම

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ව්‍යාපාරික ස්ථානවල ජල බිල් ව්‍යාපාරික ජල බිල් ලෙස හැඳින්වීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 10/ජල හා 2023.02.08 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශිය සභාවට අයත් ජල ව්‍යාපෘතියෙන් ජලය ලබා ගන්නා ඇතැම් ජල පාරිභෝගිකයින් ගෘහස්ථ ලෙස බිල් කිරීම් සිදු කර පසුව ව්‍යාපාර බවට පත් කර ඇතත් පෙර පරිදි ගෘහස්ථ අංශය යටතේම බිල් කිරීම් සිදුවන බව සඳහන් කර ඇත. මේ පිළිබඳ සමීක්ෂණයක් සිදුකර අදාළ කාණ්ඩ යටතේ අයකිරීම් සිදුකිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

මේ සදහා සමීක්ෂණයක් කරලා ගෘහ සහ ව්‍යාපාර ආයතන හදුනා ගෙන මෙම අවශ්‍ය අය කිරීම් කරන්න.

**<u>ගරු ප්‍රා.ස.ස. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා</u>**

මුල් කාලයේ නිවාස විදියට ආරම්භ කළත් දැනට විවිධ ව්‍යාපාර පටන් අරගෙන තියෙනවා. ඒවා හදුනාගන්න සමීක්ෂණයක් කරන්න. හෝටල්, ආපනශාලා ආදිය පසුකාලීනව පටන් අරගෙන තියෙනවා.

ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභාවට අයත් ජල ව්‍යාපෘතියෙන් ජලය ලබා ගන්නා ඇතැම් ජල පාරිභෝගිකයින් ගෘහස්ථ ලෙස බිල් කිරීම් සිදු කර පසුව ව්‍යාපාර බවට පත් කර ඇතත් පෙර පරිදි ගෘහස්ථ අංශය යටතේම බිල් කිරීම් සිදුවන බැවින් මේ පිළිබද සමීක්ෂණයක් සිදුකර අදාළ කාණ්ඩ යටතේ අයකිරීම් සිදුකිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-8. වවුචර් සදහා ගෙවීම් කිරීම</u>

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ පහත වවුචර් සදහා කඩිනමින් ගෙවීම් කළ යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

| අනු අංකය | නම | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|
| 1. | ශක්ති එන්ටප්‍රයිසස්,ඔරලෝසු කණුව ඉදිරිපිට,පල්ලේගම,ඇඹිලිපිටිය | කටුවන ප්‍රාදේශීය සභාවේ තෝරකොළයාය ජල බලාගාරයේ පැනල් බෝඩ් අලුත්වැඩියාවට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 22700.00 |
| 2. | සහන් චතුරංග මයා,වැඩ ක්ෂේත්‍ර කම්කරු,කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 6290.00 |
| 3. | ධර්මදාස රණතුංග මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 2883.00 |
| 4. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | තීන්ත 08L ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 13600.00 |
| 5. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2023.01.16 දින පැවති ඩෙංගු වැඩසටහන සඳහා සහභාගී වන නිළධාරීන්ට හා සේවක මහත්ම මහත්මීන්ට සංග්‍රහ කිරීම ට අත්තිකාරම් මුදලක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම | 6300.00 |
| 6. | එස්.දුෂාන්ති මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 4000.00 |

| | | | |
|---|---|---|---|
| 7. | එච්.ජ්.චමින්ද වික්‍රමසිංහ මයා,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 3920.00 |
| 8. | ආර්.පී.උදේශිකා මිය, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 1204.00 |
| 9. | ඕ.ජ්.ජගත් චන්දන මයා, ජගත් කන්ස්ට්‍රක්ෂන්,බඩබද්ද,මී ඇල්ල | කටුවන සති පොළ භූමියෙහි ABC ගල් ඇතිරීමට අවශ්‍ය ABC ගල් කියුබ් 7.5 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 67500.00 |
| 10. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2023.01.16 දින පැවති ඩෙංගු වැඩසටහන සඳහා සහභාගී වූ නිළධාරීන්ට හා සේවක මහත්ම මහත්මීන්ට රෝල්ස් 35 ක් හා කිරි පැකට් 35 ක් මිලදී ගැනීමට ලබා ගත් අත්තිකාරම් මුදල පියවීම | 6300.00 |
| 11. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම වෙනුවෙන් ගෙවීම(2023.01.04 සිට 2023.01.10) | 16000.00 |
| 12. | සාමාන්‍යාධිකාරි, සී/ස වි.සේ.සමුපාකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශිය සභාව සඳහා 2022.01 .01 සිට 2022.01.16 දක්වා ඉන්ධන බිල<br>• PF – 7414 - ඩීසල්- 184 L<br>• 227-5870 - ඩීසල් -132L<br>• MG-330- ඩීසල් -550L<br>• 252-6508- ඩීසල් -296L<br>• RE-8995- ඩීසල් 50L<br>• LL – 6446 - ඩීසල් 150L<br>• RC- 5539- ඩීසල් - 80L<br>• ZA-2978- ඩීසල් - 440L<br>• RE-9230- ඩීසල් 80L<br>• RD- 4364- ඩීසල් - 40L<br>• RB- 3498 - ඩීසල් 45 L<br>• 53-1634- ඩීසල් 100L<br>• 53-1634- පවර් ඔයිල් -01L<br>• ගබඩාව-පෙට්‍රල්-10 L<br>• BAK – 9907- පෙට්‍රල් - 10L | 880890.00 |
| 13. | ඩබ්.ජ්.දනිතා සුභාෂණී මිය,සෝමසිරි ස්ටෝර්ස්,හුංගම පාර,මිද්දෙනිය | 2023 ජනවාරි මස මිද්දෙනිය මහජන පුස්ථකාලයේ පුවත්පත් බිල ගෙවීම | 12690.00 |
| 14. | බී.එම්.සී.පී.බාලසූරිය මයා,506 ඒ,පනාපිටිය පාර,පොතුපිටිය,වාද්දූව | කණිෂ්ඨ සේවකයින් 49 ක් සඳහා වැහි කබා මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 164020.00 |
| 15. | එම්.දිනුෂිත් රන්දුල මයා, ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2023 ජනවාරි මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7916.00 |
| 16. | එම්.දිනුෂිත් රන්දුල මයා, ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2023 ජනවාරි මස ගමන් වියදම් ගෙවීම | 11900.00 |
| 17. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත, කිරම, | 2023 ජනවාරි මස කිරම මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 14260.00 |
| 18. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම වෙනුවෙන් ගෙවීම(2023.01.30 සිට 2023.01.31) | 3150.00 |
| 19. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම වෙනුවෙන් ගෙවීම(2023.01.10 සිට 2023.01.27) | 5630.00 |
| 20. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය සීනි,තේ කොළ,හකුරු පැකට් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 4790.00 |

| | | | |
|---|---|---|---|
| 21. | එම්.කේ.ටී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 2000.00 |
| 22. | ජේ.ඩිලාන් මයා,මිද්දෙනිය පාර,කටුවන | 2023 ජනවාරි මස කටුවන මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 13850.00 |
| 23. | එම්.එස්.සේනාරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම | 3062.00 |
| 24. | එම්.එස්.සේනාරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 5250.00 |
| 25. | සහන් චතුරංග මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස ගමන් වියදම් ගෙවීම | 5250.00 |
| 26. | පෝස්ට් මාස්ටර් ජනරාල්,තැපැල් කාර්යාලය,මිද්දෙනිය | 2023.01.31 දින සිට ඉදිරියට ලිපි තැපැල් කිරීම වෙනුවෙන් තැපැල් ගාස්තු ගෙවීම | 35000.00 |
| 27. | සාමාන්‍යාධිකාරි, සී/ස වි.සේ.සමුපාකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සඳහා 2022.01 .13 සිට 2022.01.31 දක්වා ඉන්ධන බිල<br>• LL – 6446 - ඩීසල් 150L<br>• BAK – 9907- පෙට්‍රල් - 30L<br>• MG-330- ඩීසල් -320L<br>• 252-6508- ඩීසල් -280L<br>• RE-9230- ඩීසල් 70L<br>• PF – 7414 - ඩීසල්- 302 L<br>• ZA-2978- ඩීසල්- 240 L<br>• RE-8995- ඩීසල් 62L<br>• RB- 3498 - ඩීසල් 59 L<br>• RD- 4364- ඩීසල් - 40L<br>• 53-1634- ඩීසල් 120L<br>• SNH-2011153- ඩීසල් 71L<br>• RC- 5539- ඩීසල් - 20L<br>• LK-9589- ඩීසල් - 70L<br>• ගබඩාව-පෙට්‍රල්-10 L<br>• 227-5870 - ඩීසල් -42L<br>• LL7399- ඩීසල් - 50L | 823180.00 |
| 28. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2023.01.24 පැවති පාරිසරික තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටුවට සහභාගී වූ නිලධාරී දීමනා ගෙවීම | 12000.00 |
| 29. | ආර්.ජී.නුවන් ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 12549.50 |
| 30. | ජේ.ඒ.රංජිත් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 12549.50 |
| 31. | අයි.සුනිල් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 12549.50 |
| 32. | කීර්ති අබේනායක මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 12549.50 |
| 33. | එම්.ඒ.චමින්ද කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 5928.00 |
| 34. | කේ.කේ.ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 5928.00 |
| 35. | කේ.සී.සංජීව මයා,සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 4000.00 |

| | | | |
|---|---|---|---|
| 36. | අධ්‍යක්ෂ ජනරාල්,මාර්ග සංවර්ධන අධිකාරිය,තංගල්ල | 2022.12.27 මිද්දෙනිය නගරයේ ස්ථාන 03 ක මාර්ග පළඳු කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 1160106.21 |
| 37. | ඩබ්.ඒ.වසන්ත කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස බිල් බෙදා අවසන් බැවින් එම මසට හිමි දීමනාව ගෙවීම | 1850.00 |
| 38. | ඕ.ඩී.ඩී.චමිල් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 දෙසැම්බර් මස බිල් බෙදා අවසන් බැවින් එම මසට හිමි දීමනාව ගෙවීම | 1850.00 |
| 39. | ජී.රශ්මි රවීනා මෙය, කටුවන ප්‍රාදේශීය සභාව | 2023 ජනවාරි මස වරිපනම් ප්‍රතිශෝධන කටයුතුවලට සහය වීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 33600.00 |
| 40. | මුදල් භාරකරු ක.ප්‍රා.ස | අයි.පී මංජුල මහතාගේ රියදුරු බලපත්‍ර අලුත් කිරීම සඳහා වැය වූ මුදල් ගෙවීම. | 4525.00 |
| 41. | ඩබ්.කේ චාමර සඳරුවන් 52/A,හොරකවත්ත,වතුකන්ද , කටුවන | 2022 වර්ෂයට මිද්දෙනිය වෙළඳපොළ පොදු වැසිකිළිය ටෙන්ඩරය ලබා ගැනීමට තැන්පත් කරන ලද 25% ආරක්ෂිත ඇප තැන්පත් මුදල නිදහස් කිරීම. | 6300.00 |
| 42. | ඩබ්.කේ චාමර සඳරුවන් 52/A,හොරකවත්ත,වතුකන්ද, කටුවන | මිද්දෙනිය නව වෙළඳපොළ පොදු වැසිකිළිය 2022 වර්ෂයට ටෙන්ඩරය තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල | 2000.00 |
| 43 | කේ.එස්.එස්.සි .සමරසිංහ සුරාජ් මොටර්ස් ඇක්ඩ් සර්විස් ,කටුවන | 252.6508.-90A LK – 9589- 1209A , 227- 5870-90A ,LL -6446- 100A බැටරි මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම. | 269117.00 |
| 44 | මාතර හාඩ්වෙයාර් කටුවන පාර, මිද්දෙනිය | කා.ප්‍රා . සභාවේ මිද්දෙනිය උප කාර්යාල ගොඩනැගිල්ල අලුත් වැඩියා කිරීම අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම. | 306580.00 |
| 45 | මුදල් භාරකරු ක.ප්‍රා ස | සුලු මුදල් 35 ම ප්‍රතිපූර්ණය කිරීම 2023.01.04 -2023.01.31 | 11405.00 |
| 46 | මුදල් භාරකරු ක.ප්‍රා ස | සුලු මුදල් 35 ම ප්‍රතිපූර්ණය කිරීම 2023/02/06 -2023/02/09 | 1600.00 |
| 47 | අමරසේකර පහළවිතාන,376,ජයසෙත, රොහල් පාර,ඇඹිලිපිටිය. | ක.ප්‍රාස .හා පුස්ථකාලය 04 සඳහා ,"කැටකිරිල්ලී" සංදේශයේ නම් කෘති 08 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 1600.00 |
| 48 | සනොන් ට්‍රේඩ් කම්ඩයික්(පුද්) සමාගම , තල් අරඹ, කඩුරුගමුව.මාතර | 2A-2976 බැකෝ යන්ත්‍රයට අවශ්‍ය අමතර කොටස් හා සේවාවන් ලබා වෙනුවෙන් ගැනීම. | 140415.00 |
| 49 | ඩී.බී.ජේ. පුෂ්ප කුමාර ජන හිත මෝටස් මිද්දෙනිය. | කටුවන ප්‍රා.ස සතු RE - 9230 ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 7,700.00 |
| 50 | ඩී.බී.ජේ. පුෂ්ප කුමාර ජන හිත මෝටස් මිද්දෙනිය. | කටුවන ප්‍රා.ස සතු RC - 5539 ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 23350.00 |

| | | | |
|---|---|---|---|
| 51 | ඩී.බී.ජේ. පුෂ්ප කුමාර<br>ජන හිත මෝටස් මීද්දෙනිය. | කටුවන ප්‍රා.ස සතු RC - 7796 ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 19550.00 |

ගරු ප්‍රා.ස.ස. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව මුදල් කමිටුවට ඉදිරිපත් නොවූ වවුචර් සඳහා කඩිනමින් ගෙවීම් කළ යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලූ සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-9. කැකිරිඔබඩ ජල ව්‍යාපෘතියේ විදුලි බිල සම්බන්ධව

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

කැකිරිඔබඩ ජල ව්‍යාපෘතියේ විදුලි බිල සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 10 හා 2023.02.08 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශිය සභාව විසින් පවරා ගන්නා ලද කැකිරිඔබඩ ජල ව්‍යාපෘතියේ ජල බිල 2022 දෙසැම්බර් මස සිට සභාව විසින් ගෙවිය යුතු බැවින් එහි නම ඉදිරියේදි වෙනස් වී එන තෙක් විදුලි බිල් ගෙවීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස.සුගත් සරඹගේ මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ස.ආරියරත්න ඒකනායක මැතිතුමා.**

අපි මේ ජල ව්‍යාපෘතිය පවරා ගෙන නේද තියෙන්නේ. ඒ නිසා ගැටළුවක් වෙන එකක් නැහැ.

ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභාව විසින් පවරා ගන්නා ලද කැකිරිඔබඩ ජල ව්‍යාපෘතියේ ජල බිල 2022 දෙසැම්බර් මස සිට සභාව විසින් ගෙවිය යුතු බැවින් එහි නම ඉදිරියේදි වෙනස් වී එන තෙක් විදුලි බිල් ගෙවීම සම්බන්ධවත් විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-10. ෆ්ලෑෂර් අලුත්වැඩියා කිරීම

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ෆ්ලෑෂර් අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි මැයෙන් අංක kps/16/සැපයුම් හා 2023.02.08 දිනැති ලිපියට අනුව කටුවන ප්‍රාදේශිය සභාව සතු 200W ෆ්ලෑෂර් 24ක් අලුත්වැඩියා කිරීම සඳහා අදාළ සැපයුම් ආයතන මගින් මිල කැඳවීම් කර සභා අරමුදලින් සකස් කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ඒත් එක්කම මන්ත්‍රීතුමන්ලාට අපි කොට්ඨාශ 17 ට දෙක බැගින් ලබාදිලා තියන ෆ්ලෑෂර් අක්‍රිය වෙලා නම් ඒවා ප්‍රතිශංස්කරණ කටයුතු සඳහා මෙහෙට නැවත භාර දෙන්න. හොඳ තත්වයේ පවතින ෆ්ලෑෂර් පිළිබඳව දැනුවත් කරන්න. ඒවා මෙහාට භාර දෙන්න ඕන. ඒ පිළිබඳ ගබඩාව භාර නිළධාරින් සමග කථා කරන්න.

ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභාව සතු 200W ෆ්ලෑෂර් 24ක් අලුත්වැඩියා කිරීම සඳහා අදාළ සැපයුම් ආයතන මගින් මිල කැදවීම් කර සහා අරමුදලින් සකස් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08-11. බැකෝ යන්ත්‍රයේ ඉදිරිපස ටයර් ලබා ගැනීම
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

බැකෝ යන්ත්‍රයේ ඉදිරිපස ටයර් ලබා ගැනීම මැයෙන් බැකෝ රියදුරු එම්.එස්. සේනාරත්න මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ZA 2978 අංක දරණ බැකෝ යන්ත්‍රයට ටයර් දෙකක් ලබා දෙන මෙන් ඉල්ලුම් කර ඇත. ඒ අනුව තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස ජේ.ටී.ශාන්ත මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මේ ටයර් අරගෙන දෙන්න ඕන. අපි ඒ සඳහා අනුමැතිය ලබා දෙමු.

ඒ අනුව ZA 2978 අංක දරණ බැකෝ යන්ත්‍රයට ටයර් දෙකක් ලබාදීම සඳහා තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08-12. වරාපිටිය පොළ සකස් කිරීම සඳහා ABC මිලදී ගැනිම
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

වරාපිටිය පොළ සකස් කිරීම සඳහා ABC මිලදී ගැනිම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 09 හා 2023.02.01 දිනැති ලිපිය අනුව වරාපිටිය පොළෙහි මාළු විකුණන ස්ථානයෙහි වැසි දිනවල මඩ සහිත වළවල් සෑදිම නිසා පොළට පැමිණෙන පාර්ශවයන්ට ඉතා දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වන බැවින් එය පිළිසකර කිරීමට ABC කියුබ් 3.10 අවශ්‍ය බව දන්වා ඇත. ඒ අනුව එය තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත මිලදී ගෙන අවශ්‍ය පිළිසකර කිරීම් සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. රමණි හල්පෙගමගේ මැතිතුමිය යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව වරාපිටිය පොළෙහි මාළු විකුණන ස්ථානයෙහි වැසි දිනවල මඩ සහිත වළවල් සෑදිම නිසා පොළට පැමිණෙන පාර්ශවයන්ට ඉතා දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වන බැවින් එය පිළිසකර කිරීමට අවශ්‍ය ABC ප්‍රමාණය තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත මිලදී ගෙන අදාළ පිළිසකර කිරීම් සිදු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08-13. දොඩුවල වඩුවදෙනිය යා කරන මාර්ගය සඳහා සිලින්ඩර් මිලදී ගැනීම
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

දොඩුවල වඩුදෙනිය යා කරන මාර්ගය සඳහා සිලින්ඩර් මිලදී ගැනිම මැයෙන් අංක කප්‍රාස 09 හා 2023.02.01 දිනැති ලිපියට අනුව මෙම මාර්ගය සකස් කිරීම සඳහා විෂ්කම්භය 1.5 අඩි 4 සිලින්ඩර් 3ක් සහ විශ්කම්භය 2.5 හා අඩි 8 සිලින්ඩර් 1ක් අවශ්‍ය බව දන්වා ඇත. මේ සඳහා තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත අවශ්‍ය මිලදී ගැනීම් සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. මානෙල් දිසානායක මැතිතුමිය යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව දොඩුවල වඩුදෙනිය යා කරන මාර්ගය සකස් කිරීම සඳහා අවශ්‍ය සිලින්ඩර් තාක්ෂණික නිළධාරි වාර්තාවක් මත මිල කැඳවීම් කර සහා අරමුදලින් මිලදී ගැනිම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08-14. කිරම කඩපල අංක 01 කඩ කාමරය සම්බන්ධව
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

කිරම කඩපල අංක 01 කඩ කාමරය සම්බන්ධවයි මැයෙන් කිරම, කඩපල, අංක 01,ධම්මික ටී රූම්, ලිපිනයෙහි පදිංචි ජී.බී.මාලනී මිය විසින් 2023.02.09 දිනැතිව සිදුකර ඇති ඉල්ලීම අනුව ඇය විසින් අංක 01 කඩ කාමරය සඳහා යොදා ඇති ප්‍රධාන දොරට අමතරව වලස්මුල්ල- මිද්දෙනිය පාරට මුහුණ ලා තවත් දොරක් තමන්ගේ වියදමෙන් සවිකර ගැනීමට අවසර ඉල්ලා ඇත. ඒ අනුව ඒ සඳහා තාක්ෂණික නිළධාරි වාර්තාව මත අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. රමණි හල්පෙගමගේ මැතිතුමිය යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව කිරම කඩපල අංක 01 කඩ කාමරය සඳහා යොදා ඇති ප්‍රධාන දොරට අමතරව වලස්මුල්ල- මිද්දෙනිය පාරට මුහුණ ලා තවත් දොරක් බදුකරු විසින් තමන්ගේ වියදමෙන් සවිකර ගැනීම සඳහා තාක්ෂණික නිළධාරි වාර්තාව මත අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08-15. මෝටර් ග්‍රේඩරය සඳහා ටයර් ලබා ගැනිම
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මෝටර්ග්‍රේඩරය සඳහා ටයර් ලබා ගැනීම මැයෙන් රියදුරු ජී.සමීර මධුශංක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව මෝටර් ග්‍රේඩරය සඳහා ඉදිරිපස ටයර් දෙකක් සහ ටියුබ් 2ක් ලබා දෙන මෙන් ඉල්ලුම් කර ඇත. ඒ අනුව තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. මානෙල් දිසානායක මැතිතුමිය යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව මෝටර් ග්‍රේඩරය සඳහා ඉදිරිපස ටයර් දෙකක් සහ ටියුබ් 2ක් තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත මිලදී ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08-16. දොඩම්ගහහේන මාර්ගය ප්‍රතිශංස්කරණය කර ගැනීම
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

දොඩම්ගහහේන මාර්ගය ප්‍රතිශංස්කරණය කර ගැනීම සම්බන්ධවයි මැයෙන් මාතර , හදුගල, වීදිපොළ , 103/2 ලිපිනයෙහි පදිංචි ජී.එම්.සමන්ත යන අය විසින් 2023.01.06 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව එම මාර්ගය සකස් කර දෙන ලෙස සිදු කර ඇති ඉල්ලීමට අනුව සභාවේ යන්ත්‍ර සූත්‍ර මගින් පාර දෙපස කාණුව සකස් කිරීමේදි එක් නිවෙස් හිමියෙකු විසින් ඔහුගේ නිවසට යන මාර්ගයේ කොන්ක්‍රිට් ලැල්ලට හානි කිරීම සම්බන්ධව පොලිසියේ පැමිණිල්ලක් සිදු කර ඇත. මෙම කාර්යය ප්‍රෙද්ශවාසින්ගේ ඉල්ලිම පරිදි ප්‍රාදේශිය සභාව මගින් සිදු කළ බවත් එහි නීතිමය තත්වය පිළිබඳවත් අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ස. මානෙල් දිසානායක මැතිතුමිය යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රා.ස.ස කේ.එච්.චන්ද්‍ර සේන මැතිතුමා.

මේ සම්බන්ධව පොලිසියේ පැමිණිල්ලක් ගියා නේද?

ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

මම පෞද්ගලිකවම මේ මාර්ගය පිළිබඳ දන්නවා. ගම් වාසින් විසින් පාර කපලා කාණු සකස් කරලා දෙන්න කියලා අපෙන් සිදුකළ ඉල්ලීමට අනුව අපේ JCB යන්ත්‍රයත් ලබා දුන්නා. සභාවෙන් තමයි පාර කපලා මෙතන කාණුව සකස් කළේ. ගමේ අයත් සහභාගි වුණා. අඩි 16 පාරක අඩි 09ක් දක්වා කුඩා කරලා .ඒක අනවසර ඉදිකිරීමක් නිසා අපි ඒ සඳහා මැදිහත් වුණා. එම නිවසට යන මාර්ගයේ කොන්ක්‍රිට් ලැල්ලට හානි කිරිම සම්බන්ධව ඒ ගෙවල් හිමියා පොලිසියේ පැමිණිල්ලක් දමලා. නමුත් මෙහි නිතිමය තත්වය පිළිබඳ අපි පොලිසියත් , ගෙවල් හිමියත් දැනුවත් කරමු.

ඒ අනුව දොඩම්ගහහේන මාර්ගය ප්‍රතිශංස්කරණය කිරීමේදි එක් නිවෙස් හිමියෙකුගේ නිවසට පිවිසෙන මාර්ගයේ කොන්ක්‍රිට් ලැල්ලට සිදු වූ හානිය සම්බන්ධව සිදුකර ඇති පැමිණිල්ලට අදාළව එහි නීතිමය තත්වය පිළිබඳ අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු සභිකවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 09.ප්‍රගතිය සාකච්ඡා කිරීම

**ගරු ප්‍රා.ස.ස එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මේ කරමැටිය පොළෙහි තත්වය මම දිගින් දිගටම කථා කරනවා. මම ඡායා රූප අරගෙන ආවා. ඒත් එක්කම එහි කාණු පද්ධතිය ශුද්ධ කරලා දෙන්න කියලා මම කිව්වා. පොළේ වැටවල් විනාශ කරමින් බැද්ද වැවිලා. ඒත් එක්කම පොළේ රෙදි දාන අයට කිසිම පහසුකමක් නැහැ. ඒ අය රෙදි දාන්න කෝටුකැලි බැඳලා සකස් කර ගෙන. ඒ නිසා මේ දේවල් ඒ අයට හදලා දෙන්න. මේ පොළ වලින් ලැබෙන ආදායමින් මේ දේවල් කරන්න පුළුවන්. වෙනත් ප්‍රතිපාදන අවශ්‍ය නැහැ. අපි ඒ අයගෙන බදු අයකරනවා. ඒ මුදල් ඇති මේ පොළවල් සංවර්ධනය කරලා දෙන්න.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ඔය කරමැටිය පොළේ බැද්ද වැවිලා තියන ටික අපි ප්‍රයෝජනයට ගන්නෙ නැහැ. නමුත් අපි ඔය ටික කම්කරුවන් දාලා ශුද්ධ කරමු. ඒත් එක්කම පොළේ රෙදි දාන්න අවශ්‍ය ස්ථාන අපි මුදල් තියන වෙලාවක සකස් කරමු.

**ගරු ප්‍රා.ස.ස ආරියරත්න ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මමත් මේ සභාවේ යම් යම් යෝජනා , සංවර්ධන කටයුතු යෝජනා කළා. ඒවායෙන් ඇතැම් කරුණු කාරණා ඉෂ්ට වුණා. නමුත් ඇතැම් ඒවා ඉටු නොවුණෙ ඒ සඳහා ප්‍රතිපාදන නොමැති හේතුවෙන් කියලා මම හිතනවා.

ඒත් එක්කම මම මේ සභාව තුළින් මහා සාගරයක් නම් වූ පළාත් පාලන ක්ෂේත්‍රය පිළිබඳව යම් කොටසක් අධ්‍යයනය කර ගන්න ලැබුණා. එහිදි සභා පනත් තුළින් මෙහි ක්‍රමවේදය පිළිබඳ යම් යම් කරුණු කාරණා අපිට දැනගන්න පුළුවන්. එහිදි මට මතක් කළ යුතු විශේෂ කරුණක් විදියට මේ සභා පනත් මගින් සභාවෙහි ධුරාවලිය ගරු සභාපතිතුමන්, උප සභාපතිතුමන්, සභිකවරුන් වශයෙන් වෙන් කර සඳහන් කරනවා. එහිදි සභා රැස්වීම තුළ අසුන් පැනවීමේදි ජේෂ්ඨත්වය හා අනුපිළිවෙළ අනුව එම ආසන පනවා තිබීම වැදගත්. ඒ නිසා මම යෝජනා කරනවා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ජේෂ්ඨත්වය හා අනුපිළිවෙළ මත මෙම ආසන පැනවීම සුදුසුයි කියලා. මම ස්වාධින මන්ත්‍රිවරයෙක් ලෙස අවසාන ආසනය හිමි වුණත් මගේ හඩ ඉදිරියට ඇහෙනවා. ඒ නිසා ගැටළුවක් වෙන්නේ නැහැ. නමුත් මම මහාමාත්‍ය ඩී.එස්.සේනානායක මැතිතුමන්ගේ පොකුරු ගම්මාන ව්‍යාපෘතිය සම්බන්ධව මේ අවස්ථාවේ මතක් කර සිටිනවා. අපේ රටේ ජාතින් අතර තියන විවිධත්වය මත තමයි යුද්ධයක් ඇතිවුණේ. නමුත් මේ පොකුරු ගම්මාන ව්‍යාපෘතිය තුල විවිධ ජාතින් එකතු කරලා ඒ ජාතින් අතර එක් ගම්මානයක් තුළ සුහදත්වය, සහයෝගය වර්ධනය කිරීම තමයි අරමුණු කළේ. ඒ නිසා මම හිතන්නේ මේ සභාව තුළ වුණත් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි අසුන් ගැනීමෙන්,ගැටළු සාකච්ඡා කිරීමෙන්, අපේ සහයෝගිතාවය වර්ධනය කිරීම තුළ ජනතා සුබ විහරණය සැලසෙන බව මතක් කර සිටිනවා. ප්‍රාදේශිය සභා තුළ අපිට එය කරන්න පුළුවන්. අපි ඉදිරියේදි එවැනි හොද සාධනීය මට්ටමකින් කටයුතු කරමු කියා යෝජනා කරමින් සියලු දෙනාටම සුභ පතමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රා.ස.ස සුගත් සරඹගේ මැතිතුමා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. ගිය සභා වාරය අපි අවසන් සභා වාරය ලෙස හිතුවත් එය එහෙම වුණේ නැහැ. අපි නැවත මේ මාසයෙත් හමුවුණා. කෙසේ වෙතත් වසර 05ට ආසන්න කාලයක් අපි සියලු දෙනා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ගරු සභාපතිතුමන්ට මේ කටයුතු කර ගෙන යාමට සහයෝගය ලබා දුන්නා. ගරු ප්‍රා.ස.ස ආරියරත්න ඒකනායක මැතිතුමන් කියනවා වගේ මෙතනට පැමිණෙන්නෙ විවිධ අදහස් මතිමතාන්තර තියන පුද්ගලයින්.ඒ ඒ අයගේ අදහස් විවිධයි . ඒ නිසා ඒ අදහස් එකිනෙක ගැටෙනවා. ඒ ගැටීම මත තමයි නිවැරදි තීරණ වලට එන්න පුළුවන්. අපි පෞද්ගලිකව එකිනෙකා අතර තරහක් නැහැ. නමුත් මේ අදහස් මත ගැටුම් හේතුවෙන් එකිනෙකාගේ හිත් රිදීම් ඇතිවෙන්න ඇති . එසේ නොවන්නට අපි අතර පෞද්ගලික තරහක් නැහැ. අපි නැවත මේ සභාව නියෝජනය කරනවද නැද්ද කියන එක තීරණය කරන්නේ ජනතාව. ඒ කෙසේ වෙතත් ගරු සභාපතිතුමන්, උප සභාපතිතුමන් සහ පක්ෂ විපක්ෂ සියලු සභිකවරුන් හට මම සුභ පතනවා. ඔබ සියලු දෙනාටම ඉදිරි සභාව නියෝජනය කිරීමට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රා.ස.ස එම්. ඩී.සුගතදාස මැතිතුමා**

ගරු සභාපතිතුමණි, සියලු දෙනාගෙන්ම අවසරයි. අපි විවිධ පක්ෂ නියෝජනය කරමින් මේ සභාවෙහි සභික ධුරයන් ඉසිළුවා. එහිදි අපිට ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් සභික ධුර තුනක් ලැබුණා. ඉදිරියේදි පළාත් පාලන මැතිවරණයක් තියේවි කියා අපි බලාපොරොත්තු වෙනවා. මේ සභාව තුළ ජනතාව අපි කෙරෙහි විශ්වාසය තියලා මේතනට එවන්නේ ඒ අයගේ ප්‍රශ්න ගැටළු පිළිබඳ අපි මේ ස්ථාන වල කථා කරලා ඒවාට පිළිතුරක් ලබා දේවි කියලා බලාපොරොත්තුවෙන්. කෙසේ නමුත් අපි අපිට හැකි අයුරින් ගරු සභාපතිතුමන්ට මේ ජනතාව වෙනුවෙන් ප්‍රශ්න ගැටළු

ඉදිරිපත් කළා. ඇතැම් අවස්ථාවල ඒ දේවල් ඉටු කළා. ඇතැම් අවස්ථා වල ඒ දේවල් නොලැබුණා. කෙසේ නමුත් අපි විපක්ෂයක් විදියට යම් යම් දේවල් පිළිබඳ තර්ක විතර්ක කළා. ඒවා ඉටු කිරීම පාලක පක්ෂයෙන් කළ යුතු දෙයක් . ඒවා ඉටු කිරීම තුළින් වාසි අත්වෙන්නේ ඔබතුමන්ලට. අපිට පුළුවන් කථා කරන්න පමණයි. එහෙම ජනතාව වෙනුවෙන් කථා කළා මිසක අපේ පෞද්ගලික උවමනාවන් ඉටු කර ගන්න අපි කටයුතු කළේ නැහැ. ගරු සභාපතිතුමන් ඇතුළු සියලු මන්ත්‍රීමණ්ඩලයට , ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට අපි අපිට හැකි පමණින් සහයෝගය ලබා දුන්නා. ඉදිරියටත් එසේ කිරීමට බලාපොරොත්තු වෙමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු ප්‍රා.ස.ස එච්.ඒ.ගාමිණී සංජීව මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, අඹගහහේන පිගලැල්ල මාර්ගයෙහි යාමට නොහැකි තරම් අබලන් තත්වයේ පවතිනවා. එය ප්‍රතිශංස්කරණය කිරීමට කටයුතු කරලා දෙන්න කියලා ඉල්ලනවා. ඒත් එක්කම සියලුම දෙනාටම සුභ පතනවා.

**<u>ගරු ප්‍රා.ස.ස ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, මිද්දෙනිය වටරවුමෙහි කණුව ඉවත් කරලා වටේට ලයිට් හතරක් සවි කරන්න අවශ්‍ය කටයුතු කරන්න. එතකොට තමයි එතන ලස්සන වෙන්නේ. අපිට සභාවෙන් එවැනි කණු හතරක් ගන්න පුළුවන්. ඒ කාර්යය ගැන බලන්න.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි මේ සභා බල ප්‍රදේශය තුළ ජනතාවගේ ඉල්ලීම් වෙනුවෙන්, ඒවා ලබා දෙන්න හැකි පමණ කටයුතු කළා. පක්ෂ විපක්ෂ භේද සැළකුවේ නැහැ. එතනදි වියදමට වඩා අවශ්‍ය කාරණය පිළිබඳව හිතලා කටයුතු කළා. ඒ නිසා මේ වියදම් පිළිබඳව කථා කරනවට වඩා අපි කරපු වැඩ පිළිබඳව සොයා බලන්න කියලා ඔබතුමන්ලාට කියනවා. අපි කිසිදු දෙයක් අයථා විදියට පරිහරණය කළේ නැහැ. අපිට ලැබෙන වරප්‍රසාදවත් ඇතැම් වෙලාවට අපි ගන්නෙ නැහැ. ඒ නිසා මේ පිළිබඳ ඔබතුමන්ලා කථා කරද්දි සොයා බලලා කථා කරන්න.

## <u>10. - ස්තුතිය හා නිමාව.</u>

අද දින 2023 වර්ෂයේ පෙබරවාරි මස මහ සභා රැස්වීම සඳහා පැමිණ එය සාර්ථක කර ගැනීම සඳහා සම්බන්ධ වුන අපේ හිටපු ගරු සභාපතිතුමන් , ගරු සභිකතුමන්ලා තුමියන්ලා සහ ලේකම්තුමා, නිළධාරිතුමිය, ඇතුළු සියළුම දෙනාට ස්තුතිවන්ත වෙමින් අද දවසේ සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් කරනවා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප.ව 02.00 ට පමණ සභා තොමෝ සතුටින් විසිර ගියහ.

…………………

අයි. ජී. මහින්ද,

සභාපති,

කටුවන ප්‍රාදේශීය සභාව,

මිද්දෙනිය.